# අනන්තය





ආචාර්ය
## වික්‍රමබාහු කරුණාරත්න



සමාජ ගැටුම්වල වේදනාවන් පළමුවෙන්ම ඇහෙන්නේ කලාව තුළයි. ඒ නිසාම තාක්ෂණයේ දියුණුවෙන් ඇති වෙන පෙරළිය ගැන ලකුණු සමාජය තුළ මතු වුණේ නූතන සමාජය ගැන අලුත් අදහසක් එන්නටත් කලින්. කැමරාව නිසා චිත්‍ර කලාවට තිබුණ නිදහස නැති වෙලා අලුත් මාවතකට යන්න වුණා කියල සමහරු හිතනව. එත් ඉම්ප්‍රෙෂනිසම් කියන චිත්‍ර කලා ගුරුකුලය ඇති වුණෝ මේ බලපෑම් ඇත්තටම දැනෙන්නට පෙරයි. මොනේ, සෙසාන් වගේ චිත්‍ර ශිල්පියෝ ඇති වුණෝ එදාට පෙර තිබුණ යථාර්ථවාදී චිත්‍ර කලාව අභියෝගයට ලක් කරමින්. ඒ අය පෙනෙන දේ ඉස්මතු කරල තමන්ට ලැබුණ හැඟුම දිස් වන විදියට ඇඳීමේ ගුරුකුලය ඇරඹුවා. මේ විදියට ඇරඹුන ගමන සංකේත භාවිතයටත්, මූර්ති රූප සංයෝජනය දෙසටත් ගමන් කළා. ඒත් පළමු ලෝක යුද්ධය සමඟ ඇති වන පිපිරීම තුළ වඩාත් වේගයෙන් චිත්‍ර කලාව වර්ධනය වුණා. ඒ යුගය නිර්ධන පංති විප්ලවයේ යුගයක්. 1917 රුසියානු විප්ලවය පමණක් නෙවෙයි ස්පාඤ්ඤයේ සිවිල් යුද්ධය දක්වා ලෝකය පුරා ඇති වුණ නැගිටීම් මගින් ලෝකය වෙනස් කිරීම පිළිබඳ අදහස් උතුරා යන්න පටන් ගත්තා. වැඩවර්ජන සමඟ ඇති වුණ වීදි සටන් වලින් යුරෝපය පුරාම පිරිල තිබුණ. 1926 මහා බ්‍රිතාන්‍යයේ මහා වැඩවර්ජනයම නිර්ධනීන්ගේ ඇති ශක්තිය ගැන අලුත් අදහස් බුද්ධි ලෝකයටම ඇතුළ් කළා. ජෝන් මේනාඩ් කේන්ස් පංති සාමයේ ආර්ථික යෝජනා ඉදිරිපත් කළේ මේ විදියට නිර්ධන පංතීන් ශක්තිය පෙන්නුව නිසයි.

මේ කාලපරිච්ඡේදය කලාවේ විශාල නැගීමකට හේතු වුණා. අලුත්ම මාවත් ඔස්සේ කලා ලෝකයම විකාශනය වෙන්න පටන් ගත්තා. ඒ කාලය තුළ ඇති වුණ ගැම්ම තවමත් නිවිල නෑ කියලයි කියන්න පුළුවන්. නිදහස්ව කලාවේ නිර්මාණයන්ට මේ කාලය තුළ ඉඩ ලැබුණේ නිර්ධන පංතියේ නැගිටීම තුළ ඇති වුණ ශක්තිය උඩයි. සමාජයේ ධනේශ්වර මතවාදය පමණක් නොවේ රාජ්‍ය බලයත් පිපිරිලා අඩමාන තත්ත්වයට පත්වෙලා තිබුණා. මේ කාලයේ නැගී ආ කලාකරුවන් අතර පැබ්ලෝ පිකාසෝ (චිත්‍ර), ස්ට්‍රැවින්ස්කි (සංගීතය), ඩී.එච්. ලෝරන්ස් (නවකථා), සෙමර්සෙට් මෝම් (නවකථා), බර්ටෝල් බ්‍රෙෂ්ට් (නාට්‍ය) වැනි අය සිටීම පුදුමයක් නොවේ. නමුත් මේ කාලය අවසන් වුණේ දෙවැනි ලෝක යුධ සූදානම තුළ. එය නව තාක්ෂණයේ විප්ලවය ඇරඹීමත් සමඟ සමපාත වුණා. අද අපි යොදා ගන්න තාක්ෂණ විප්ලවයේ සියලු බීජයන් වැපිරුණේ මේ කාලයේදී. මේ තාක්ෂණ යොදා ගැනීම හා සංවර්ධනය වෙනුවෙන් ප්‍රබල අධිකාරිවාදී මනුස්ස සංවිධාන රාමු අවශ්‍ය බව ඒ යුගයේදී අවධාරණය වුණා. හිට්ලර්ගේ ෆැසිස්ට්වාදයත්, ස්ටැලින්ගේ නිලධාරීවාදයත් දෙකම එකටයි මතු වෙලා අවේ. පංති සමාජ අවශ්‍යතා අනුව දෙපැත්තකට දැම්මත් මේ දෙකෙන්ම කෙරුණේ විද්‍යාත්මක මෙහෙයුමේ නාමයෙන් මිනිසා අධිකාරිවාදී ලෙස යොදා ගැනීමයි. ඒ අනුව කලාවේ නිදහස මුළුමණින්ම වැළලිලා ගියා. ඒ වෙනුවට විද්‍යාවේ ප්‍රායෝගික අවශ්‍යතාවය නිරූපණය කිරීමට ඊනියා යථාර්ථවාදී කලාවට බහින්න බල කෙරුණා. ස්ටැලින් සමාජවාදී ජයග්‍රහනය වෙනුවෙන් යථාර්තවාදී කලාවක් ඉල්ලන කොට, හිට්ලර් ආර්ය ජාතික ජයග්‍රහන වෙනුවෙන් යථාර්ථවාදී කලාවක් ඉල්ලුවා. මේ විදියට කලාකරුවාට තහංචි දැමීමෙන් ඇති වුනේ පුදුමාකාර කලා පාළුවක්.

දෙවැනි ලොක යුද්ධය තුළින් ෆැසිස්ට්වාදය බිඳ වැටුනත්, ස්ටැලින්වාදය බිඳ වැටුනේ නෑ. ඒ වුණත් බටහිර යුරෝපයේ නිදහස් සාකච්ඡාවක් දෙවැනි ලෝක යුද්ධයෙන් පසු ඇති වූ නිර්ධන පංති ව්‍යාපාරයේ නැගිටීමත් සමඟ බිහි වුණා. ඒ යුගයේ කලාකරුවන් දෙපයින් නැගී සිටීමට වාරුව හැටියට යොදා ගත්තේ මේ නිර්ධන පංති ව්‍යාපාරයේ නැගිටීමයි. ඒත් දශක කීපයක් ඇතුළතදි ධනවාදයට අලුත් ශක්තියක් ලබා ගැනීමට පුළුවන් වුණා. මෙය සිදු වුණේ දෙවැනි ලෝක යුධ සමයේ ලබාගත් තාක්ෂණික ජයග්‍රහන ඉදිරියට ගෙන ගොස් ස්වයංක්‍රීය යන්ත්‍ර වැඩි වශයෙන් යොදා ගැනීමට පටන් ගැනීම උඩයි. බුද්ධි යන්ත්‍ර විප්ලවය නැත්නම් සයිබර් විප්ලවය ඇරඹුනේ ඒ විදියටයි. මෙයට දාර්ශනික පදනම සැපයුවේ තර්ක යථාවාදය, නැත්නම් තර්ක අනුභූතිවාදයෙනුයි (Logical empiricism)' ඒත් මෙය ජනතාව අතරට ගෙන ආවේ

*<u>මේ විදියට තාක්ෂණයේ වෙනස්වීම පස්සෙන් වේගයෙන් කලාකරුවන් හඹාගෙන යන්නට ගියොත් වෙන්නේ කලාව අවසන් වීමයි.</u>*

විද්‍යාත්මක ක්‍රමය, ආකාරගතවාදය, නැත්නම් රටාවාදය යන නම්වලින්. මේ කොයි විදියට හැඳින්වූවත් මේ චින්තනයේ පදනම, නිශ්චිත දේවල්වලට කඩල, වෙන් කරල ලෝකය හඳුනා ගැනීමට කටයුතු කිරීමයි. ඒ විතරක් නෙවෙයි සයිබර් තාක්ෂණය තුළ ඉතා වේගයෙන් වෙනස් වන යථාර්ථයක් ගැන අවධාරණය කරන්න වුණා.

මේ විදියට තාක්ෂණයේ වෙනස්වීම පස්සෙන් වේගයෙන් කලාකරුවන් හඹාගෙන යන්නට ගියොත් වෙන්නේ කලාව අවසන් වීමයි. මෙයට මතවාදී පදනම සපයන පශ්චාත් නුතනවාදයට අනුව නූතන චිත්‍ර කලාව යනු පිළිබිඹු කළ නොහැකි දේ ඇති බව පෙන්වීමයි.

මේ නුව අනන්තය (Infinity)" ශූන්‍යය (Zero)" පූර්ණ කුලකය (Complete set)" සංකීර්ණ සංඛ්‍යාව (Complex number) ආදී ගණිතමය සංකල්ප පවා චිත්‍රය තුළින් හඳුන්වා දිය හැකියි. මෙය තර්ක ශ්‍රොණය හා කලාව එකට ගැටගැසීමක් නැතිනම් කලාව විද්‍යාවේ වලිගයේ ගැටගැසීමක්. සමහරු මෙ කාන්ට් (Kant) ඉදිරිපත් කළ 'Sublime as distinct from the mere by beautiful' යන අර්ථය සමඟ ගලපන්න හදනවා. එහෙත් කාන්ට් අදහස් කළේ ලස්සන කියන්නේ සිත ආසාවෙන් පුරවන දෙයට වඩා ආධ්‍යාත්මක හැඟීම ඇති කරන පහන් සිත කියන එකයි. ඒ අනුව කලාවෙන් කළ යුත්තේ සාමාන්‍ය නිසඟ ආසාවන් ජනිත කිරීම ඉක්මවා ගැඹුරු අධ්‍යාත්මික සුවයක් ලබාදීමයි. ඒත් ලියාටාර්ඩ්ගේ අදහස තුළ එවැනි සදාචාරවාදී අදහසක් නෑ. ඔහු කියන්නේ අධ්‍යාත්මික අදහසක් ගැන නෙවෙයි. නිකම්ම නිරපේක්ෂ හෝ මූර්ත සංකල්ප ගැනයි. සාමාන්‍ය ආසාවන් වර්ධනය කිරීම විප්ලවයේ මාවත හැටියටත් ඔහු 1973 වන විට සැලකුවා. ඉදිරියෙන් ඉන්න කලාකරුවන් කළ යුත්තේ මේ රාගික ආසාවන් අවුස්සා ගැනීම වෙනුවෙන් තිබෙන යථාර්ථය ගින්නට දැමීමයි. එසේම ඔහු කිව්වා තරුණයන්ගේ ජයග්‍රහනයන් ඇත්තේ රාගික ආසාවල ශක්තිය උඩයි කියල.

ලයොටාඩ් ආරම්භ වුණේ ප්‍රංශයේ 1950 ගණන්වල වමේ ව්‍යාපාරය තුළයි. 1968 විප්ලවයේදී ඔහු සටන් නායකයෙක් හැටියට ක්‍රියා කළා. එදා සටනෙන් පස්සේ වැඩ කරන ජනතාවගේ ව්‍යාපාරයේ පසුබැස්ම උඩයි, ඔහුට වැඩ කරන ජනතාවගේ ව්‍යාපාරය ගැන විශ්වාසය නැතිව ගියේ. ඇත්ත වශයෙන් පශ්චාත් නූතනවාදයේ ආරම්භය නිර්ධන පංති ව්‍යාපාරයේ වැටීමත් සමඟ ඉතාම කිට්ටුවෙන් මේ විදියට බැඳිල තියෙනවා. ඔහු පශ්චාත් නූතන තත්ත්වය කියන ලිපිය ලිව්වේ කලාව ගැනවත්, දේශපාලනය ගැනවත් හිතලම නෙවෙයි. කැනඩාවේ ප්‍රංශ කථා කරන කියුබෙක් ප්‍රාන්තයේ ජාතිකවාදී ආණ්ඩුවක් 1977 දී ඇති වුණ වෙලාවෙයි ලයොටාඩ් ට ඉල්ලීමක් ආවේ ''නූතන දැනුම'' ගැන එම පලාතේ සරසවියට වාර්තාවක් හදල දෙන්න කියල. මෙහි




Kant

සාකච්ඡා කෙරුණේ වැඩි වශයෙන්ම විද්‍යාව සරසවියට අවශ්‍ය වන හැටි ගැන. විද්‍යාව ඉගැන්වීම ගැන ලියන වාර්ථාවක අනියම් ලෙසයි කලාව ගැන හෝ මතු කරන්න පුළුවන් වෙන්නේ. මේ ලියවිල්ලෙන් තමයි ඔහු මාක්ස්වාදයේ සමස්ථ මතවාදී බව ගැන කියල පලිච්චි කරන්නේ. මිනිසාගේ මුලු ජීවිතයම හා සමාජයම වෙනස් කිරීමට කතා කරන සියලු මහා මතවාද අවසන් වෙලා කියල ඔහු කිව්වත්, ඇත්තටම ඔහුගේ විරුද්ධත්වය

*<u>කලාව කියන්නේ හැඟීම් සියුම් ලෙස හඳුනා ගෙන අනෙක් අයට අත්විඳීම වෙනුවෙන් යළි ජනිත කිරීමයි. අත්විඳින අනෙකා මොන තරම් රස හෝ දුක් වේදනා හරහා ගෙන යනවාද යන්න උඩ කලාවේ තත්ත්වය මැණ බලාගන්නට හැකියාව ලැබෙනවා.</u>*

තිබුණේ මාක්ස්වාදය පැතිරීම ගැනයි. වැඩියෙන්ම ඔහුට පෙන්නන්නට බැරි වුණේ මිනිසා සාමූහික සමාජයක් කරා යා යුතු බව කියන අදහස. මෙය විද්‍යාත්මක නොවන බවයි ඔහු කියන්නේ. ඒත් ඔහුට අමතක වෙලා විද්‍යාත්මක දැනුම හෙවත් තර්ත අනුභූතිකවාදය (Logical Empiricism) තුළින් ලැබෙන දැනුමත් සීමිත බව. ඒ අතර තර්කඅනුභූතිකවාදය මුලු මහත් මිනිස් සමාජයම හැම පැත්තෙන්ම බැඳ ගත් යෝධ මතවාදයක් හැටියට දැන් ක්‍රියාත්මක වෙන බවත් ඔවුන්ට පෙනෙන්නේ නෑ. විද්‍යාවෙන් හැම දේම හොයා බැලීමත් මහාම මතවාදයක්.

ලයෝටාර්ඩ් ට අනුව පශ්චාත් නූතනවාදය, නුතනවාදයෙන් පසුව ඇති වන දෙයක් නෙවෙයි. එය ඇත්තටම පිබිදෙන්නට හදන තත්ත්වයන් හැමවිටම පැවැතීමයි. අතීතකාමයෙන් වෙලී සිටිනවාට වඩා ඇතිවෙන්නට යන නිර්මාණය ගැන මුදිතාවෙන් වෙලී සිටීමයි මෙතැන වෙන්නේ හා විය යුතු. මේ නිසා යථාර්ථය බිඳ දැමීමට නිරන්තරයෙන් යොමු වීම අමුතුම සුන්දරත්වයක්.

මේ ලෙසට පරීක්ෂණ කරමින් අලුත් දේ කරමින් සිටින කලාකරුවාට වැඩ කරන්නට නීතිරීති තිබෙනවාද? නූතන විද්‍යාත්මක ලෝකයේ ස්වභාවය තමා නිදහස් වෙළඳපොල තුළ කටුයතු කිරීම. ඊට වඩා නීතියක් නෑ. තේරුම් ගැනීමට අවශ්‍ය වන්නේ හඳුනාගත හැකි දේවල් පමණයි. ඒවා රටාගත කිරීම හා ආකාරගත කිරීමෙන් විවිධ අලුත් දේවල් හදන්න පුළුවන්. මෙය ධනපති ක්‍රමය තුළින්ම මතු වන තත්ත්වයක්. මේ කරුණුවලින් පෙන්වන්නේ තර්ක අනුභූතිකවාදී ලෝකය තුළ කලාව එක්කෝ මුළුමණින්ම මූර්ත විය යුතුයි. නැත්නම් පරීක්ෂණ තුළින් මතු කරගත යුතුයි. මේවා කලා කෘති ලෙසට වටහා ගන්නේ මොන ක්‍රමයටද කියල ඒවා තුළින්ම බලාගන්නට හැකියාව ලැබෙනවා. ඒත් ඇත්තටම සිදුවන්නේ සමස්ත වෙළඳපොල තුළ කලා ලෝකයේ වෙළඳ ආයතන හා ධනපති ඇගයුම් ආයතන විසින්ම කලාව තීන්දු කිරීමයි. මෙය චිත්‍ර කලාව සම්බන්ධයෙන් මූලිකවම ඉදිරිපත් කළත් පොදුවේ සෑම කලා අංශයකමත් බලාගන්නට පුලුවන් කතන්දරයක්. මේ විදියට කලාව වෙළඳපොල තුළ බලවතුන් විසින් තීන්දු කරන තත්ත්වයට පත්වෙනව නම් ඉතිරි වෙන්නේ කලාවක් නෙවෙයි, ව්‍යාජ පෙනුමක් පමණයි.

කලාව කියන්නේ හැඟීම් සියුම් ලෙස හඳුනා ගෙන අනෙක් අයට අත්විඳීම වෙනුවෙන් යළි ජනිත කිරීමයි. අත්විඳින අනෙකා මොන තරම් රස හෝ දුක් වේදනා හරහා ගෙන යනවාද යන්න උඩ කලාවේ තත්ත්වය මැණ බලාගන්නට හැකියාව ලැබෙනවා. අමු රාගාන්විත හැඟීම් වලට වඩා ඒවායින් ඈත් වී පහන් සිත් ඇති කර ගනිමින් කරුණාව, මෛත්‍රිය තුළින් අනෙකා දෙස බැලීම වඩා හොඳයි කියා කෙනෙක් කියන්න පුළුවන්. තව කෙනෙක් එය ප්‍රතික්ෂේප කර නිසඟ ආසාවන් උච්ඡ කිරීම හොඳ දෙයක් කියල කියන්න පුළුවන්. මේ අනුව කලාව මතවාදීව වර්ගීකරණය වීම කලාකරුවාට නවත්වන්න බෑ. ලයෝටාඩ් කියන විදියට වෙළඳපොල තුළ තේරෙන මට්ටමට හැඟීම් ප්‍රකාශ කිරීම හා හැඟීම් එළියට ගැනීමත් හොඳ දෙයක්. ඒ තමා පශ්චාත් නූතනවාදී කලාව. හැබැයි ඔවුන් කියන විදියට පුද්ගල අත්දැකීම් ප්‍රකාශ කිරීමට කලාකරුවා වෙළඳපොලේ නිදහස ඇතුළට ගැනීම හා එමගින් පවතින රාමුවට අවනත කිරීම යෝධ දෘෂ්ඨිවාදයක් නෙවෙයි. ඒත් ධනපති අර්බුදය තුළ නිදහස් වෙළඳපොල විහිළුවක් බවට පත් වුණා. කලාවත් විහිළුවක් වෙන්න ඉස්සෙල්ලා වෙළඳපොලට යට වීමෙන් මිදෙන්න වේවි. ■